# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகதமெதுர", காணிச் செயலகம், 1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla.


මගේ අංකය / எனது இல / MY NO } 3/සං/4/මොණ-දැව

ඔබේ අංකය / உமது இல / YOUR NO }

දිනය / திகதி / DATE } 2012. 05. 15

චක්‍රලේඛ අංක : 2012/01

සියළුම ප්‍රාදේශිය ලේකම්වරු,

සියළුම නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරු හා සහකාර ඉඩම් කොමසාරිස්වරු (අන්තර් පළාත්),

රජයේ ඉඩම්වල දැව සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට

අදාල වන ඉඩම් නියෝග 111 , 112 , 113 හා 114 සංශෝධනය කිරීම

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේද එකඟත්වය ඇතිව පරිසර අමාත්‍යාංශයේ ලේකම් විසින් "දීමනා පත්‍ර / දීර්ඝ කාලීන බදු හා බලපත්‍ර යටතේ අන්සතු කළ රජයේ ඉඩම් වල හා වෙනත් රජයේ ඉඩම්වල ගස් හෙලීමට හා ඉවත් කිරීමට අවසර දීම" යන මැයෙන් නිකුත් කරන ලද 2010.12.29 දිනැති අංක 2010/4 දරණ චක්‍රලේඛය මඟින් එතෙක් මෙම විෂයට අදාලව රජය විසින් නිකුත් කර තිබූ චක්‍රලේඛ 8 ක් අවලංගු කරමින් නව උපදෙස් නිකුත් කර ඇත. එම චක්‍රලේඛයේ උපදෙස්වලට අනුකූලව රජයේ ඉඩම් පිළිබඳ කාර්ය සංග්‍රහයේ දැක්වෙන අංක 111, 112, 113 හා 114 හි සඳහන් වන ඉඩම් නියෝග එම චක්‍රලේඛය බලපැවැත්වෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කෙරේ.

02. මේ අනුව ඉහතින් සඳහන් පරිසර අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛයේ අංක 2, 3, 4, 5, 6, 12, 13, 14 සහ 15 යන ඡේද යටතේ දැක්වෙන උපදෙස් මගින් ඉඩම් නියෝග අංක 111 සිට 114 දක්වා උපදෙස් නියමිත පරිදි සංශෝධනය වූ සේ සලකන්න. තවද අදාල චක්‍රලේඛයේ උපදෙස් දී ඇති පරිදි එම විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ලේඛන සකස් කර ගැනීමටත් මෙම උපදෙස්වලට සාරානුකූලව අළුතින් නිකුත් කර ඇති ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අවසර පත්‍රයේ ආකෘතිය භාවිතා කිරීමටත් මෙයින් වැඩිදුරටත් උපදෙස් දෙනු ලැබේ.

ආර්.පී.ආර්.රාජපක්ෂ,

ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත්: 01. ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - දැ.පි.

02 . ලේකම්, පරිසර අමාත්‍යාංශය - දැ.පි.

03. සියළුම දිස්ත්‍රික් ලේකම්වරු - දැ.පි.

04 . සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරු - අ.ක.ස.

05. වන සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් - දැ.පි.


දුරකථනය / தொலைபேசி / Telephone } 011-2797400
ෆැක්ස් / பெக்ஸ் / Fax } 011-2864051
වෙබ් ලිපිනය / இணையம் / Web Address } www.landcommdept.gov.lk
ඊමේල් / ஈ-மெயில் / E-mail } landcom@landcommdept.gov.lk